| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : ඉස්ලාම් ධර්මය | පත්‍රය: I | කාලය: පැය 01 යි |

## I පත්‍රය

සැලකිය යුතුයි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- පිළිතුරු පත්‍රයේ පසු පිටෙහි දෙන ලද උපදෙස් ප්‍රවේශමෙන් කියවන්න.
- අංක 01 සිට 40 දක්වා පිළිතුරු එකිනෙක සඳහා (1) (2) (3) (4) අංක යොදා ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි නොහොත් ඉතා ගැළපෙන පිළිතුර තෝරා එයට අදාළ අංකය දෙන ලද පිළිතුරු පත්‍රයේ (×) සලකුණ මගින් පෙන්නුම් කරන්න.

---

(01) ඉස්ලාමීය විශ්වාසය ගොනු කර දීමට බිහි වූ එකම කලාව කුමක් ද?

(1) ඉල්මුල් මීරාස් (2) ඉල්මුල් ෆික්හ්
(3) ඉල්මුල් අකීදා (4) ඉල්මුල් කුර්ආන්

(02) නබි(සල්) තුමාට පසු කිලාෆතයට සුදුස්සා තෝරා ගැනීමේදී ඇතිවුණු දේශපාලන ගැටලු පදනම් කරගෙන බිහිවුණු කණ්ඩායම කුමක් ද?

(1) මුඃතසිලාවරු (2) ෂීආවරු (3) මාදුරුදීවරු (4) සහාබාවරු

(03) එක් අයකු යහක්‍රියාවක් අල්ලාහ් වෙනුවෙන් ඉටු කරයි. ඒ වෙනුවෙන් ජනයා තමා ප්‍රශංසා කළ යුතු යැයි බලාපොරොත්තු වෙයි. එම ක්‍රියාව,

(1) ෂිර්ක් වේ. (2) ඉබාදත් වේ.
(3) යහක්‍රියාවක් වේ. (4) යහපත් අමලයක් වේ.

(04) සුහුෆ් ලබා දුන් බවට අල්කුර්ආණයේ සඳහන් නබිවරු දෙදෙනා කවුරුන් ද?

(1) මූසා (අලෛ), ඊසා (අලෛ) (2) ඉබ්‍රාහීම් (අලෛ), ඉස්මායිල් (අලෛ)
(3) ෂීද් (අලෛ), ඉද්රීස් (අලෛ) (4) ඉබ්‍රාහීම් (අලෛ), මූසා (අලෛ)

(05) පහත සඳහන් කරුණු අතරින් මුස්ලිම්වරයකුට දියනෑම අනිවාර්ය වන (ෆර්ලු) කටයුත්ත කුමක් ද?

(1) ගමනක් අවසානයේ දී (2) අධිකව දහඩිය දැමීමෙන් පසු
(3) අඹු සැමියන් එක් වීමෙන් පසු (47 ජනාසාවක් නෑවීමෙන් පසු

(06) සලාතයේ ප්‍රයෝජනයක් ලෙස අල්කුර්ආනයේ සඳහන් වන කරුණ කුමක් ද?

(1) සලාතය ස්වර්ගයේ යතුර වේ.
(2) සලාතය ලැජ්ජා සහගත දේවලින් ඉවත් කරයි.
(3) සලාතය යහපත් නම් අනෙකුත් දේ යහපත් වේ.
(4) සලාතය ඇසට ප්‍රිය උපදවයි.

(07) සලාත් ඉටු කිරීමේ දී සුජුදයේ දී දෙපතුල්, දෙඅත්ල සහ පොළොවේ පතිත විය යුතු ඉතිරි අවයව කුමක් ද?

(1) දෙදණහිස්ත් නාසයේ කොනත්
(2) දෙදණහිසත් නළලත්
(3) දෙවැලමිටත් නළලත්
(4) දෙවැළමිටත් නාසයේ කොනත්

(08) සලාතයේ තවර්රුක් ඉඳුමේ අදහස කුමක් ද?

(1) පළමු අත්තහියාතය සඳහා ඉඳගන්නා ආකාරය
(2) සුජුදයන් දෙක අතර ඉඳගන්නා ආකාරය
(3) අවසාන අත්තහියාතය සඳහා ඉඳගන්නා ආකාරය
(4) ඉමාම් සලාම් දුන් පසු ඉදගන්නා ආකාරය

(09) ආලෝකය ආකාරයනුත් වහී ආකාරයෙනුත් ආරක්ෂා කළ මූලාශ්‍රය කුමක් ද?

(1) අල්කුර්ආන්
(2) අල් හදීස්
(3) අල් ඉජ්මා
(4) අල් කියාස්

(10) වහී පහළ වීමේ තැතිගැන්මෙන් නිවසට පැමිණි නබි (සල්) තුමාව තම බිරිඳ වන කදීජා (රලි) තුමිය කවුරුන් වෙත කැඳවාගෙන ගියේ ද?

(1) අබු බක්කාර් (රළි) තුමා
(2) අලී (රලි) තුමා
(3) අබ්දුල් මුතලීෆ්
(4) වරකා බින් නෞෆල්

(11) සිතෙහි තත්වයන් තුනහි කළ වැරදි සඳහා පසුතැවිලි වී ශෝකයට පත් වන සිත කුමක් ද?

(1) නෆ්සුල් අම්මාරා
(2) නෆ්සුල් ලව්වාමා
(3) නෆ්සුල් මුත්ම ඉන්නා
(4) නෆ්දුන් සලීම්

(12) නබි(සල්) තුමා වෙත දක්නට ලැබුණු යහගුණාංග නිසා ඔහුට ලැබුණු විශේෂ නාමය කුමක් ද?

(1) අල් අමීන්
(2) අල්ෆාරුක්
(3) දූන්නුරයින්
(4) අස් සිද්දීක්

(13) අල්ලාහ්ගේ විශේෂ නාමයන් අතර අල් මුඃනි යන්නෙහි අර්ථය කුමක් ද?

(1) ලබා දෙන්නා
(2) කරුණාවන්තයා
(3) පාලනය කරන්නා
(4) ධනපතියකු බවට පත් කරන්නා

(14) මංපහරන්නාගේ නායකයාට සත්‍ය පවසා එම කණ්ඩායම යහපතුන් ලෙස පත් කිරීම පිළිබඳව ගෞරවයට පාත්‍ර වූයේ කවුරුන් ද?

(1) අබුහාමිද් අල්ගස්සා (රහ්)
(2) මුහියද්දීන් අබ්දුල් කාදර් ජීලානි (රහ්)
(3) මාලික් ඉබ්නු දීනාර්
(4) අහ්මද් ඉබ්නු හන්බල්

(15) පහත සඳහන් වගුවේ 'අ' කොටසේ නබිවරුන්ගේ නම් ද 'ආ' කොටසේ ඔවුන්ට වහී පහළ වූ ක්‍රම ද දක්වා ඇත.

| අ | ආ |
|---|---|
| නබිවරුන්ගේ නම් | වහී පහල කළ ආකාරය |
| 1. ඉබ්‍රාහීම් (අලෛ) | A හඬ |
| 2. මූසා (අලෛ) | B සංඥා |
| 3. සකරියියා (අලෛ) | C සිහින |

'අ' කොටස ඇති වාක්‍ය 'ආ' කොටසත් සමඟ ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A,B,C
(2) B,A,C
(3) C,A,B
(4) C,B,A

(16) අවංක හා විශ්වාසවන්ත වෙළෙන්දා පහත සඳහන් කවුරුන් සමඟ සිටින්නේ ද?
(1) සහාබාවරුන්, තාබිඊන්වරුන්, ඉමාම්වරුන්
(2) මැලක්වරුන්, නබිවරුන්, ස්වර්ගවාසීන්
(3) නබිවරුන්, අව්ලියාවරුන්, කුතුබ්වරුන්
(4) නබිවරුන්, සිද්දීක්වරුන්, ෂුහාදාවරුන්

(17) අල්ලාහ්ආලාගෙන් පව්කමාව අයැද තව්බා කිරීම සඳහා අවශ්‍ය කොන්දේසි වලින් එකක් වනුයේ කුමක් ද?
(1) වුළු සමඟ තව්බා ඉටු කිරීම. (2) රකාත් දෙකක් ඉටු කර තව්බා කිරීම.
(3) කල පවට පසුතැවිලි වී තව්බා කිරීම. (4) මධ්‍යම රාත්‍රියේ තව්බා කිරීම.

(18) කෝවිඩ් 19 කොරෝනා වෛරසය පැතිරීම වැළැක්වීම සඳහා රජය විසින් ඇඳිරි නීති ක්‍රියාත්මක කළ අවස්ථාවේ මස්ජිදය අසල පදිංචි වී සිටි නබීල් සහ තවත් පිරිසක් නිතර නිතර මස්ජිදයේ සලාතය ඉටු කළහ. මෙම ක්‍රියාව හඳුන්වන්නේ කෙසේ ද?
(1) ඔවුන්ගේ එම ක්‍රියාව ෆර්ලු කිෆායා වේ.
(2) එය නීතියට පටහැනි ක්‍රියාවකි.
(3) 27 ගුණයක් පින් ලැබෙන ක්‍රියාවකි.
(4) වසංගතය යනු ආගමේ සඳහන් නොවන දෙයකි.

(19) ධර්මයේ මධ්‍යස්ථභාවය ඉක්මවන්නන් පිළිබඳව නබි (සල්) තුමාණෝ කෙසේ පවසා තිබේ ද?
(1) මධ්‍යස්ථභාවය ඉක්මවා ක්‍රියා කරන්නන් විනාශ වන්නෝ ය.
(2) මධ්‍යස්ථභාවය ඉක්මවා ක්‍රියා කරන්නන් පමණක් ස්වර්ගයට ඇතුළු වේ.
(3) මධ්‍යස්ථභාවය ඉක්මවා ක්‍රියා කරන්නන් පරලොවෙහි ජයග්‍රහණ කරයි.
(4) මධ්‍යස්ථභාවය ඉක්මවා ක්‍රියාකරන්නන් මෙලොව හා පරලොව ජය ලබයි.

(20) හජ් උම්රා වගකීම ඉටු කිරීමේ දී නොකළ යුතු ක්‍රියාව කුමක් ද?
(1) කාන්තාව මුහුණ පෙන්වීම. (2) පිරිමින් හිස ආවරණය නොකිරීම.
(3) ශරීරයේ හා වස්ත්‍රයේ සුවඳ විලවුන් තැවරීම. (4) සම් සම් ජලය අධික ලෙස පානය කිරීම.

(21) මම අනෙකුත් නබිවරුන්ට වඩා කරුණු හයකින් සුවිශේෂ වී ඇත්තෙමි. යනුවෙන් මුහම්මද් (සල්)තුමාණෝ පැවසූහ. එයින් එකක් වනුයේ කුමක් ද?
(1) මුළු මහත් භූතලයම මා හට මස්ජිදයක් ලෙස ද පාරිශුද්ධ ද්‍රව්‍යයක් ලෙසට ද පත් කර ඇත.
(2) මාගේ උම්මත්වරුන් වසංගත රෝගවලින් ආරක්ෂා කර ඇත.
(3) මාගේ සහාබාවරු පරලොව දක්වා ප්‍රභාවත්ව සිටියි.
(4) මා ගැන ප්‍රශංසා කරන්නන් නොකඩවා සිටියි.

(22) සකාත් ලැබීමට සුදුස්සන් අතර ආමිල් යනුවෙන් සඳහන් වන්නේ කවුරුන් ද?
(1) කිසිදු ආදායමක් නොලද අන්ත දුගියා (2) ප්‍රමාණවත් පමණ ආදායමක් නොලබන්නා
(3) ඉස්ලාමය වෙත සිත බැඳුණු අය (4) සකාත් සේවාවල යෙදී සිටින්නන්

(23) රමළාන් මාසයේ විශේෂාංග වලින් එකක් වනුයේ කුමක් ද?
(1) රමළානයේ නබි(සල්) තුමා මිහිරාජ් ගමනේ යෙදීම.
(2) රමළානයේ නබි (සල්) තුමා හිජ්රත් කළහ.
(3) රමළානයේ නබි (සල්) තුමාට අල්කුර්ආනය පහළ වීම.
(4) රමළානයේ නබි (සල්) තුමාගේ පව් කමා කරනු ලැබීම.

(24) හදවතින් ඉස්ලාමයේ බැඳී සිටීමට මගක් වන බව ඉමාම් ගස්සාලිතුමා පැවසුවේ කුමක් ද?

(1) අල්ලාහ් තේරුම් ගැනීම (2) සලාතයේ යෙදීම

(3) අල්ලාහ් මත තවක්කුල් තැබීම. (4) දන් දීම.

(25) වස්තුව හෝ දරුවන් ප්‍රයෝජනවත් නොවන එම දිනයේ ප්‍රයෝජනවත් වන බව කුර්ආනයේ සඳහන් වන්නේ මෙයින් කුමක් ද?

(1) පාරිශුද්ධ සිත (2) තමා ලබා දුන් දානමාන

(3) යහපත් දෙමාපියන් (4) යහපත් මිතුරා

(26) පහත සඳහන් 'අ' වගුවේ සටහන් කර ඇති වාක්‍යවල අරාබි පදය 'ආ' වගුවේ සඳහන් කර ඇත.

| 'අ' | 'ආ' |
|---|---|
| 1. සැමියා බිරිඳව විවාහ බන්ධනයෙන් නිදහස් කිරීම. | A. ෆස්කු |
| 2. විවාහයක කොන්දේසි පූර්ණ වී නොමැතිව අවලංගු වීම. | B. ලිහාර් |
| 3. බිරිඳ සැමියාගෙන් විවාහ බන්ධනයෙන් නිදහස ලැබීම. | C. තලාක් |
| 4. බිරිඳව ශාරීරික වශයෙන් තම මවට සමාන කිරීම. | D. කුල්උ |

'අ' කොටසේ ඇති වාක්‍ය 'ආ' කොටසක් සමඟ ගැළපූ විට ලැබෙන නිවැරදි පිළිතුර කුමක් ද?

(1) A,B,D,C (2) B,A,C,D (3) C,A,D,B (4) D,A,C,B

(27) වහී මත්ලූව් ලෙස හඳුන්වන්නේ කුමක් ද?

(1) අල්කුර්ආන් (2) හදීස් කුද්සි (3) හදීස් මුතවාතිර් (4) සුන්නාහ්

(28) නබි (සල්) තුමාගේ හදීස් ප්‍රථමයෙන් ග්‍රන්ථාරූඪ කිරීම කුමන කලීෆාතුමාගේ කාලයේ ආරම්භ කලේ ද?

(1) උමර් ඉබ්නු අබ්දුල් අසීස් (රහ්) (2) හාරූන් රෂීද් (රහ්)

(3) අබූබක්කර් සිද්දීක් (රලි) (4) උමර් අල්ෆාරූක් (රලි)

(29) මද්රසතුල්, අසර්, මද්රසුල් රහ්යු යන චින්තන අංශ දෙකම අන්තර්ගත කර විසඳුම් ලබා දුන් ඉමාම්වරයා කවුරුන් ද?

(1) ඉමාම් අබූ හනීෆා (රහ්) (2) ඉමාම් ෂාෆි (රහ්)

(3) ඉමාම් මාලික් (රහ්) (4) ඉමාම් අහ්මද් (රහ්)

(30) පහත සඳහන් වාක්‍ය කුලෆාඋර් රාෂිදූන්වරු සමඟ සම්බන්ධ වේ.

A. තමාගෙන් පසු කාලීෆාවරයා පත් කිරීම.
B. නීති ක්ෂේත්‍රය ස්වාධීනව ක්‍රියා කර වූ අය
C. අල්කුර්ආනය ග්‍රන්ථාරූඪ කළ අය
D. නාවික හමුදාව පිහිට වූ අය
E. හිජ්රි දින දර්ශනය හඳුන්වා දුන් අය

ඉහත ප්‍රකාශ අතුරින් කලීෆා උමර් රලි තුමාගේ සේවය පමණක් සම්බන්ධ ප්‍රකාශ වනුයේ,

(1) A,C (2) B,D (3) B, E (4) D,E

(31) කිහිපදෙනෙකු එකතු වී තමාගේ ප්‍රාග්ධනය හා මානව සම්පත් ආදිය හවුලේ එකතු වී මෙහෙයවන ව්‍යාපාර ක්‍රමය කෙසේ හඳුන්වයි ද?

(1) අල් මුරාබහා (2) අස් සලම් (3) අල්මුෂාරආ (4) අල් මුෂාරකා

(32) මනමාලිය මනමාලයාට නීත්‍යානුකූලව භාරදීමට ඉතා සුදුසු පුද්ගලයා කවුරුන් ද?
(1) මනමාලියගේ මවගේ සහෝදරයා (2) මනමාලියගේ සුළු පියා
(3) මනමාලියගේ මවගේ පියා (4) මනමාලියගේ සහෝදරියගේ ස්වාමියා

(33) 'ෂාම්' ප්‍රදේශයේ ආණ්ඩුකාරවරයා වන මුආවිය (රලි) තුමාගේ නායකත්වය යටතේ නාවික හමුදාව ස්ථාපිත කිරීමට මග පාදා දුන්නේ කවුරුන් ද?
(1) අබූබක්කර් (රලි) (2) උමර් (රලි)
(3) උස්මාන් (රලි) (4) අලි (රලි)

(34) මිනිසා වියදම් කරන දිනාර් වලින් වැඩියෙන් ම ප්‍රයෝජනවත් වන බව නබි (සල්) තුමා සඳහන් කළ කරුණ කුමක් ද?
(1) දරුවන්ගේ අධ්‍යාපනය සඳහා වියදම් කිරීම.
(2) මස්ජිදයක් නිර්මාණය සඳහා වියදම් කිරීම.
(3) පොදු සේවාවන් සඳහා වියදම් කිරීම.
(4) තමාගේ පවුල වෙනුවෙන් වියදම් කිරීම.

(35) අසන්බෙ සරිත්තිරම් යන නව කථාව රචනා කළේ කවුරුන් විසින් ද?
(1) ටී.බී. ජායා (2) අබ්දුල්ලා ෆාතිබ්
(3) වාපිච්චෙයි මරික්කාර් (4) සිද්දි ලෙබ්බේ

(36) ශ්‍රී ලංකා මුස්ලිම්වරු දේශීය යහපතට දක් වූ දායකත්වයන්ගෙන් එකක් කුමක් ද?
(1) දේශීය තේ වගාව හඳුන්වා දීම.
(2) පේෂ කාර්මිකයන් කැඳවාගෙන පැමිණ පේෂ කර්මාන්තය හඳුන්වා දීම.
(3) ඉංග්‍රීසි වෛද්‍ය ක්‍රමය හඳුන්වා දීම.
(4) ගුවන් ගමන් සේවය වර්ධනය කිරීම.

(37) නබි (සල්) තුමාගේ මිහිරාජ් ගමන සැකයකින් තොරව මුලින් ම පිළිගත් කෙනා කවුරුන් ද?
(1) අලි (රලි) (2) උස්මාන් (රලි) (3) උමර් රලි (4) අබූ බක්කර් (රලි)

(38) දේව භක්තිකයන් වන වලිවරුන්ට අල්ලාහ් විසින් ලබා දුන් විශේෂ දායාදය කුමක් ද?
(1) මුඃජිසාත් (2) නුබුව්වත් (3) කුරාෆත් (4) කරාමත්

(39) හජ් ෆාර්ලු හි අඩංගු නොවන ක්‍රියාවක් වන්නේ කුමක් ද?
(1) දුල්හජ් 9 දා අරෆාවෙහි රැඳීම. (2) දුල්හජ් 9 දා රාත්‍රියෙහි මිනාවෙහි නැවතීම.
(3) සෆා මර්වා අතර දිවීම. (4) හිස කෙස් ඉවත් කරයි.

(40) 'හස්බියල්ලාහ් වනිමෙල් වකීල්' යන දුආව පාරායනා කළ අවස්ථාව කුමක් ද?
(1) ඉබ්‍රාහිම් (අලෛ) ගින්දරින් පුලුස්සන විට
(2) යූනුස් (අලෛ) මාළුවාගේ කුස තුළ සිටින විට
(3) අය්යුබ් (අලෛ) රෝගාතුරව සිටින විට
(4) මුහම්මද් (සල්) තුමාණෝ තව්ර් ගුහාවේ සිටින විට

| බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව | | | |
|---|---|---|---|
| අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය - 2020<br>උපකාරක ප්‍රශ්න පත්‍රය | | | |
| ශ්‍රේණිය 11 | විෂය : ඉස්ලාම් ධර්මය | පත්‍රයː II | කාලයː පැය 02 යි |

## II පත්‍රය

සැලකිය යුතුය.

- පළමුවැනි ප්‍රශ්නය ඇතුළු තවත් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නය පිළිතුරු සඳහා ලකුණු 20 බැගින් ද, අනෙකුත් එක් එක් ප්‍රශ්න සඳහා ලකුණු 10 බැගින් ද ලකුණු ලැබේ.

---

- පළමුවැනි ප්‍රශ්නය ඇතුළුව තවත් ප්‍රශ්න 05 කට පමණක් පිළිතුරු සපයන්න.

(01) i. තව්රාත්, සබූර් ආගම් පහළ කළ නබිවරුන් දෙදෙනා කවුරුන් ද?
ii. ජලයේ ප්‍රධාන වර්ග දෙක ලියා එක් උදාහරණයක් බැගින් ලියන්න.
iii. ෆර්ලු වර්ග දෙක සඳහන් කර එක් උදාහරණයක් බැගින් ලබා දෙන්න.
iv. සකාත් සදකා යන දෙකෙහි වෙනස දක්වන්න.
v. තස්කියතුන් නෆ්ස් යනුවෙන් හඳුන්වන්නේ කුමක් ද?
vi. කුෆ්රය ඇති කරන ආකාර දෙක හඳුන්වා ඒ සඳහා එක් එක් උදාහරණය බැගින් දක්වන්න.
vii. මුහම්මද් නබි (සල්) තුමාට පසු වෙනත් නබිවරයකු නොපැමිණෙන බවට සඳහන් හදීසයක් සඳහන් කරන්න.
viii. 'එක් කද්රයකින් තවත් කද්රයකට ගමන් කරන්නෙමි' යනුවෙන් උමර් (රළි) තුමා පැවසූ අවස්ථාව ලියන්න.
ix. සකාතයේ ෆර්ලු දෙක ලියන්න.
x. උපවාසය හා ශාරීරික නිරෝගීතාවය සමඟ ඇති සම්බන්ධතාවය දක්වන හදීසයක් ලියන්න. (ලකුණු 2 X 10= 20)

(02) i. කුර්ආන් නීති මූලාශ්‍රයක් බැවින් එහි ප්‍රධාන ක්‍රියා දෙකක් ලියන්න.
ii. පළමු මුස්හෆ් පිළිබඳ ඉතිහාසය කෙටියෙන් පහදන්න.
iii. නබිවරුන් පස් දෙනෙකු නම් සඳහන් කර ඔවුන් එක් එක් අයෙකු සඳහා ලබා දුන් හාස්කම් පිළිබඳව කෙටියෙන් ලියන්න.

(03) i. ආදරය දක්වීමේ කොටස් දෙක නම් කරන්න.
ii. මුස්ලිම් උම්මතයන් ගැන නිර්වචනයෙහි සඳහන් වන වැදගත් ගුණාංග තුනක් ලියන්න.
iii. දන්දීම මගින් ලැබෙන ප්‍රයෝජන පහක් ලියන්න.

(04) i. සීරා යන ග්‍රන්ථය මගින් කුමක් වටහා ගන්නේ ද?
ii. කුරෙෂ්වරුන් විසින් නබි (සල්) තුමාගේ දෑවා සේවයට විරුද්ධ වූ කාරණාවන් දෙකක් සඳහන් කර පහදන්න.
iii. නබි (සල්) තුමාගේ ධර්ම ප්‍රචාරය වැළැක්වීම සඳහා කුරෙෂ්වරු යොදාගත් උපක්‍රමයක් නම් කර නිදසුන් සහිතව පහදන්න.

(05) i. ඉජ්මා හා කියාස් නොමැතිව වෙනත් සහායක මූලාශ්‍ර හතරක් නම් කරන්න.
ii. ඉජ්මාව පිළිපැදීම නිසා ඇති වන ප්‍රයෝජන තුනක් සඳහන් කරන්න.
iii. කියාස් හි කරුණු හතර නම් කර එය කෙටියෙන් පහදන්න.

(06) i. මහ්රම් පිළිබඳ කොටස් දෙක නම් කරන්න.
ii. ෂරියා නීතිය අනුව විවාහයේ අරමුණු තුනක් පහදන්න.
iii. ඉස්ලාමයේ පවුල් ජීවිතයේ සැමියා විසින් බිරිඳට ඉටු කළ යුතු යුතුකම් ලියන්න.

(07) පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් සඳහා කෙටි සටහන් ලියන්න.
i. ඉස්ලාමීය දෘෂ්ටියෙන් සඟවා තැබීම්.
ii. ශ්‍රී ලංකාවේ මුස්ලිම්වරුන්ගේ දේශීය දායකත්වය
iii. කාලීෆා අබූබක්කර්තුමා ඉටු කළ සේවාවන්
iv. මාධ්‍යය අනුගමනය කළ යුතු ගුණාංග

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සංවර්ධන අංශය

# ඉස්ලාම් ධර්මය

## පිළිතුරු පත්‍රය

## I පත්‍රය

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 1. | 3 | 11. | 2 | 21. | 1 | 31. | 4 |
| 2. | 2 | 12. | 1 | 22. | 4 | 32. | 2 |
| 3. | 1 | 13. | 4 | 23. | 3 | 33. | 3 |
| 4. | 4 | 14. | 2 | 24. | 1 | 34. | 4 |
| 5. | 3 | 15. | 3 | 25. | 1 | 35. | 4 |
| 6. | 2 | 16. | 4 | 26. | 3 | 36. | 2 |
| 7. | 2 | 17. | 3 | 27. | 1 | 37. | 4 |
| 8. | 3 | 18. | 2 | 28. | 1 | 38. | 4 |
| 9. | 1 | 19. | 1 | 29. | 2 | 39. | 2 |
| 10. | 4 | 20. | 3 | 30. | 3 | 40. | 1 |

(මුළු ලකුණු 01 X40 = 40)

## II පත්‍රය

(01) i. තව්රාත් මූසා (අලෛ), සබූර් දාවූද් (අලෛ)

ii. අල් මාඋත් තහූර් - මුහුදු ජලය, ගංගා ජලය
අල්මාඋත් තාහිර් - පිණිදිය, තැඹිලි වතුර
අල්මාඋන් මුතනජ්ජිස් - මුත්‍රා
(මෙවැනි නිවැරදි උදාහරණ දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකයි)

iii. ෆර්ලු අයින් - පස්වේල් සලාතය
ෆර්ලු කිෆායා - ජනාසා සලාතය
(මෙවැනි නිවැරදි උදාහරණ දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකයි)

iv. සකාත් - ෆර්ලු වන වගකීමකි, කොන්දේසි ඇත.
සදකා - සුන්නතයකි. කොන්දේසි නැත.
(මෙවැනි නිවැරදි පිළිතුර ලියා ඇත්නම් ලකුණු දෙකයි)

v. සිත පිරිසිදු කිරීම - ආදේශ කිරීම ලා අන්තර්ගත වන සියලුම දුර්ගුණාංගවලින් ද තව සිතත් ක්‍රියාවත් ආරක්ෂා කරගෙන සිත දමනය කොට පාරිශුද්ධව තබා ගැනීම. (ලකුණු 02)

vi. විශ්වාසය හා සම්බන්ධ අල්ලාහ් විශ්වාස නොකිරීම.
ක්‍රියා හා සම්බන්ධ - අල්කුර්ආනය අවමන් කිරීම, ඉරා දැමීම.
වචනය හා සම්බන්ධ - ආගමික වගකීම් වලට විහිළු කිරීම.
(නිවැරදි පිළිතුරු දෙකක් ලියා ඇත්නම් ලකුණු දෙකයි)

vii. 'මා සමගින් නබිවරුන්ගේ පැමිණීම අවසන් වේ. (තිර්මිදි)
(මෙවැනි හදීසයක් ලියා ඇත්නම් ලකුණු දෙකයි)

viii. ෂාම් ප්‍රදේශයේ කොළරා රෝගය පැතිරී ඇති ආරංචිය දැනගත් විට උමර් (රලි) තුමා ඒ දෙස ගමන් කිරීම වැළැක්වීම, එවිට අබූ උබෙයිදා (රලි) තුමා අල්ලාහ් කද්රයෙන් මිදීයාමට උත්සහ කරන්නේ දැයි විමසීම. (ලකුණු 02)

ix. නියත් තැබීම, සුදුස්සන්ට ලබා දීම. (ලකුණු 02)

x. 'ඔබ උපවාසය රැක නිරෝගීව ජීවත් වන්න. (ලකුණු 02)

(02) i. නීතිය සෘජුව ලබා දීම.
නීතිය උදෙසා පදනම ලබා දීම / ඉජ්තිහාදය සඳහා මග පෙන්වීම. (ලකුණු 02)

ii. කලීෆා අබුබක්කර් (රළී) තුමාගේ කාලයේ යමාමාවේ සාහාබරුන් මිය යෑම. කුර්ආනය නැති වී යාදෝ යන බිය ගොනු කිරීමට උපදෙස් දීම. සයිද් (රළී) තුමාගේ නායකත්වයෙන් ගොනු කිරීම පැවරීම. නබිතුමාගේ කාලයේ ලියන ලද ද්‍රව්‍ය, සියුම් ලෙස අධ්‍යයනයට ලක් කර ලියා කලීෆා තුමාගේ කාලයේ ප්‍රථමයෙන් ගොනු කිරීම මුස්හෆ් වේ. (ලකුණු 03)

iii.
- මූසා (අලෛ) - සැරටිය නයකු වීම.
- සාලිහ් (අලෛ) - කලු ගලකින් ඔටුවෙකු පිටවීම.
- ඉබ්‍රාහිම් (අලෛ) - ගින්දර සිසිල් වීම.
- ඊසා (අලෛ) - රෝගීන් සුව කිරීම.
- මුහම්මද් (සල්) තුමා - අල්කුර්ආන් (ලකුණු 10)

(03) i.
- අල්ලාහ් කෙරෙහි ආදරය දක්වීම.
- මැව්ම් කෙරෙහි ආදරය දක්වීම. (ලකුණු 02)

ii.
- මධ්‍යස්ථභාවය
- යහපත පනවා අයහපත වැළැක්වීම.
- මහජනතාවට වගකීම. (ලකුණු 03)

iii.
- මෙලොව අල්ලාහ්ගේ ආදරය හා මිනිසුන්ගේ අභිමානය හිමි වේ.
- පරලොවේ දී විශේෂ දීමනාවක් හිමි වේ.
- ධනයේ වර්ධනයක් ඇති වේ.
- අනතුරු මග හැරේ
- මනසට සතුටක් සහ සහනයක් ලැබේ. (ලකුණු 05)

(ලකුණු 10)

(04) i. 'සීරා' මුහම්මද් නබී (හල්) තුමාගේ ජීවිත කථාව ගැන කීමට භාවිතා වන වචනයකි. (ලකුණු 02)

ii.
- නබිතුමාගේ පණිවිඩය මක්කාවේ ජීවත් වූ කුරෙෂිවරුන්ට අලුත් මෙන්ම තිත් ස්වරූපයක් ගත්තේ ය. (එකත්වය)
- තමාගේ යාඥා ක්‍රමයට හාත් පසින්ම වෙනස් වීම.
- තම වරප්‍රසාද අහිමි වීම බව සිතීම. (කුසල, ගෝත්‍රය) (ලකුණු 03)

iii.
- වදන් වලින් අවලාද නැගීම.
- බොරුකාරයා, හූනියම්කාරයා, පිස්සා, ගායකයා
- පරම්පරාවක් නොමැත්තා වන වදන් වලින් බැණ වැදීම.
- ශාරීරික වද හිංසා කිරීම.
- එතුමා යන මංවල කටු පිරවීම.
- ඔටුවාගේ කුණු බඩවැල් මාලයක් ලෙස පැලදීම.
- එතුමා සමඟ සිටි අයට ද හිරිහැර කිරීම. (ලකුණු 05)

(05) i. ඉස්තිහ්සාන්, ඉස්තිස්හාබ්, උර්ෆ්, ෂරිආ (ලකුණු 02)

ii.
- සමාජයේ සමගිය රැකෙයි.
- සමාජයේ හික්මීම බිඳ වැටෙයි.
- එකිනෙකට උදව් උපකාර ලබා ගැනීමේ අවකාශය සැලසීම. (ලකුණු 03)

iii.
- අල් අස්ල් - කුර්ආනය හෝ හදිසයේ හෝ ඉජ්මාව මගින් තීරණය ලබා දුන් ගැටලුව
- ෆරු - නිරාකරණය නොවූ ගැටලුව
- ඉල්ලත් - පොදු වූ ගුණාංග
- හුකුම් - හරාම් (ලකුණු 05)

(ලකුණු 10)



බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සංවර්ධන අංශය

(06) i. • තාවකාලික මහ්රම්
• ස්ථිර මහ්රම් (ලේ නෑකම, විවාහ සබඳතා, කි සබඳතා (ලකුණු 02)

ii. • සාලින් වූ පරම්පරාව බිහි කිරීම.
• කායික හා මානසික ශාන්තිය ඇති කිරීම.
• හොඳ සමාජ ක්‍රම ඇති කිරීම. (ලකුණු 03)

iii. • පවුලේ නායකයා
• බිරිඳට උදව් වේ. සැනසීම හා සතුට ලබා දේ.
• ආදර්ශමත් වේ.
• බිරිඳට හා දරුවන්ට ගරුත්වයෙන් ක්‍රියා කරයි.
• බිරිඳව තෘප්තිමත් කරයි. (ලකුණු 05)

(ලකුණු 10)

(07) i. • සඟවා තැබීම්, වෙළෙඳපොලේ භාණ්ඩ මිල වැඩි වීම.
• අපේක්ෂාවෙන් සඟවා තැබීම හරාම් වේ.
• මෙය ජනයාව අපහසුතාවයට පත් කරයි.
• භාණ්ඩ සඟවා තබන්නා පාපියෙකි.
• ඉතාමත් නපුරු යටත් වැසියා භාණ්ඩ සඟවා තබන්නාය.
• ආහාර භාණ්ඩ දින 40 කට සඟවා තබන්නා අල්ලාහ්ගේ භාරකාරත්වයෙන් වෙන් වී යන්නේ ය. (ලකුණු 02)

ii. • ශ්‍රී ලංකාවේ අපනයන භාණ්ඩ විදෙස් රටවලට අපනයනය
• යුනානි වෛද්‍ය ක්‍රමය හඳුන්වා දී වර්ධනය කිරීම.
• තවලම් ක්‍රමය හඳුන්වා දීම.
• ව්‍යාපාර උපදේශකවරු ලෙස සේවය කිරීම.
• ගාලු කොටුවේ යුධ සේනාවේ උපකාරය ලබා දීම.
• ශ්‍රී ලංකාවේ නිදහස වෙනුවෙන් එකමුතු වී දායකත්වය සැපයීම. (ලකුණු 03)

iii. • නබි තුමාට පසු කිලාපතය භාරගෙන කටයුතු කිරීම.
• ව්‍යාජ නබිවරු පරාජය කිරීම.
• සකාත් දීම ප්‍රතික්ෂේප කළ පිරිසගේ කුමන්ත්‍රණය බිඳ දැමීම.
• අල්කුර්ආනය ගොනු කොට ග්‍රන්ථාරූඪ කිරීම.
• තමන්ට පසු සුදුසු කලීෆාවරයකු පත් කිරීම.

iv. • තහවුරු වී තිබීම.
• විශ්වාසවන්තභාවය
• මධ්‍යස්ථභාවය
• ශුභසිද්ධිය රැකීම.
• සදාචාරය රැකීම.

මාතෘකා දෙකක් කෙටියෙන් විස්තර කර ඇත්නම් (5 X 5 = 10)

සම්පූර්ණ ලකුණු

I කොටස 40

II කොටස 60

මුළු ලකුණු 100


LOL.lk
Learn Ordinary Level
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර
• Past Papers • Model Papers • Resource Books
for G.C.E O/L and A/L Exams
Knowledge Bank
Master Guide
WWW.LOL.LK
CASH ON DELIVERY
HOME DELIVERY
Whatsapp contact
+94 71 777 4440
Website
www.lol.lk
Order via WhatsApp
071 777 4440